- පළමු කොටසට අදාල සියලුම ප්‍රශ්න අනිවාර්ය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

**01. මහාවංශය හා දීපවංශය යන ග්‍රන්ථ රචනා කිරීමේදී ආභාසය ලබාදී ඇති මුල් ග්‍රන්ථ වන්නේ,**

(i) වංසත්ථප්පකාසිනිය හා විනයට්ඨ කතා
(ii) නිකාය සංග්‍රහය සහ විනයට්ඨකතා
(iii) උත්තර විහාරට්ඨකතා සහ සිහල අට්ඨකතා
(iv) සිහල අට්ඨකතා සහ බෝධි වංශය

**02. ශ්‍රී ලංකාවට පැමිණි මෙහි ඇති තතු බලා ඒ පිළිබඳ වාර්තා තැබූ ඕලන්ද හා ඉංග්‍රීසි මූලාශ්‍රය වන්නේ,**

(i) බැලඩ්සගේ ලංකා පුරාවෘත්තය සහ එදා හෙළදිව
(ii) රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය සහ දේශාටන වාර්තා
(iii) එදා හෙළදිව සහ ඉන්ඩිකා
(iv) ඩිමුන්ඩෝ සහ ඉන්ඩිකා

**03. ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද්දේ,**

(i) හෝමෝ ඉරෙක්ටස් මානවයා විසිනි
(ii) හෝමෝ නියැන්ඩර්තාලෙන්සිස් මානවයා විසිනි
(iii) හෝමෝ හැබිලිස් මානවයා විසිනි
(iv) හෝමෝ සාපියන් මානවයා විසිනි

**04. දේශගුණික කලාප වල ජනාවාස ව්‍යාප්තියේ දී කඳුකර වියළි අතර මැදි කලාපයට අයත් වන්නේ,**

(i) රාවණාඇල්ල, හෝර්ටන් තැන්න
(ii) මිතිහාගල්කන්ද නෝර්වුඩ්
(iii) රාවණා ඇල්ල මැඩොල්සිම
(iv) කුඩුම්බිගල, උක්ගල්තොට

**05. ඇටසැකිළි නමා වකුටුකොට වළලා තිබීම සම්බන්ධයෙටන් සාක්ෂි ලබාගත හැකි ගල් ගුහාවකි,**

(i) පාහියන්ගල (ii) කිතුල්ගල බෙලිලෙන

(iii) රාවණා ඇල්ල (iv) කුරුවිට බටදොඹලෙන

**06. පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,**

(i) එය මුල් යකඩ යුගය ලෙස හඳුන්වයි

(ii) තොරතුරු ලබාගන්නා ලද්දේ සුසාන භූමි ආශ්‍රිතව

(iii) පූර්ණ වශයෙන් සත්ත්ව ආහාර මත පමණක් යැපීම් කරයි

(iv) ශාක ආහාර මත වැඩි යැපීමක් පෙන්නුම් කරයි.

**07. දසගම් ඇත්තන් පිළිබඳ තොරතුරු ලැබෙන්නේ,**

(i) දඹුල්ලේ කළුදිය පොකුණ සෙල්ලිපිය

(ii) සිතුල් පව්ව සෙල්ලිපිය

(iii) කොරවක්ගල සෙල්ලිපිය

(iv) කොත්ගල් කන්ද සෙල්ලිපිය

**08. ගමිකයින් ගෘහපතියන් අතුරින් පත්වු බව සඳහන් වන්නේ,**

(i) ජාතකට්ඨකතාවේ (ii) සමන්ත පාසාදිකාවේ

(iii) සද්ධර්මාලංකාරයේ (iv) ඇඹුල් ඇඹේ සෙල්ලිපියේ

**09. එල්ලංගාව හෙවත් වැව් ප්‍රපතනය නිර්මාණය කිරීමේ අරමුණක් වුයේ,**

(i) එමගින් පහසුවෙන් මහවැවක් නිර්මාණය කරගත හැකි වීම

(ii) ගම්වල ජනතාවගේ මානව සුභසාධනය ඉහළ දැමීම

(iii) ඇළමාර්ග දෙපස භූමියේ තෙතමනය ඉහළ දමා පහසුවෙන් බෝග වර්ග කිරීමට

(iv) මහ වැව් පුරවා වැඩි කුඹුරු ප්‍රමාණයක් වගා කරවීමට

**10. පොවනි රජ හෙවත් ප්‍රාදේශීය රජු ලෙස පරුමකවරුන් හඳුන්වා දී ඇත්තේ,**

(i) ඇඹුල්ඇඹේ සෙල්ලිපිය

(ii) කළුදිය පොකුණ සෙල්ලිපිය

(iii) යටහලෙන සෙල්ලිපිය

(iv) කොන්ගල් කන්ද සෙල්ලිපිය

**11. එක්තැන්සමිය යනු,**

(i) මහලේකම් යන වචනයයි

(ii) ව්‍යාවස්ථාදායකය යන්නයි

(iii) රාජසභාවේ එකඟතාවයයි

(iv) රාජසභාවේ විරුද්ධතාවයයි

**12. ක්‍රිස්තු වර්ෂයෙන් නමවන සියවසේ රචනා කරන ලද සෙල්ලිපියක ඉහළින්ම ඇති අඩසඳ සලකුණින් නිරූපණය වන්නේ,**

(i) ඉරහඳ පවත්නා තාක්කල් පවතින බවයි

(ii) දීමනාවේ පවිත්‍රත්වයයි

(iii) රාජකීයත්වය පිළිබඳවයි

(iv) දීමනාවේ පූර්ණ අණසක රජු සතුව පවතින බවයි.

**13. අතීතයේ "නවදැලි හේන" නමින් හඳුන්වන ලද්දේ,**

(i) අලුතින් ගිනිතබා සාදාගන්නා ලද හේනය

(ii) උක්ගස් සහ කපු පමණක් වගා කරන හේනය

(iii) දඬුවැටකින් ආරක්ෂා කරන ලද හේන් නොහොත් පිටබිම්ය

(iv) ඉතාමත් ඈතින් නිර්මාණය කරන ලද හේන් විශේෂයකි

**14. රෝමානුක දේශයට තානාපතින් යැවූ බව සඳහන් වන්නේ කිනම් රජුගේ රාජ්‍ය සමයේදී ද?**

(i) හයවන අග්ගබෝධි (ii) භාතිකාභය

(iii) පළමු වන ගජබාහු (iv) දෙවන ගජබාහු

**15. ක්‍රි.ව. 114 - 136 කාල සීමාවේ දී පත්තිනි දේවාලයක් විවෘත කිරීමට ඉන්දියානු චේර රාජ්‍යයට ගිය බව සඳහන් වන්නේ,**

(i) පළමු වැනි විජයබාහු (ii) පළමු වැනි කාශ්‍යප

(iii) පළමු වන අග්ගබෝධි (iv) පළමු වැනි ගජබාහු

**16. මෙරට "රතුකැට" දිවයින නමින් හඳුන්වන ලද්දේ**

(i) අරාබි ජාතික ඉබන්බතූතා (ii) පාහියන් හිමි

(iii) අල - බලසූරිය (iv) සුලෙයිමාන්

**17.** **"තුලදර සූමන" නමින් සිටි රන් කරුවෙකු පිළිබඳ හඳුන්වා ඇත්තේ,**

(i) මණ්ඩල ගල නම් ස්ථානයේ තිබූ සෙල්ලිපියේ

(ii) වෙහෙරකඩ සෙල්ලිපියේ

(iii) වේගිරිය දේවාලය අසල සෙල්ලිපියේ

(iv) මුතුගල්ල නම් ස්ථානයේ තිබූ සෙල්ලිපියේ

**18.** **පැරණි බෞද්ධ ආරාම වල නායක භික්ෂුන් වහන්සේලා යටතේ සිටින භික්ෂුන් වහන්සේලා හඳුන්වන ලද්දේ,**

(i) සද්ධි විහරිය (ii) ථේර

(iii) අන්තේවාසික (iv) භාණකවරුන්

**19.** **වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය හැඳින්වීමට භාවිතා කරන්නේ,**

(i) විද්‍යුත් ශක්තිය

(ii) චාලක විද්‍යුත් ශක්තිය

(iii) පීඩන ශල්කනය

(iv) ස්ථිතික ජල විද්‍යා මූලධර්මය

**20.** **අවකාශය මැනීමට අනුව වර්තමාන අක්කර දෙකකට සමාන භූමි ප්‍රදේශයක් අතීත මිනුම් අනුව ගණනය කළ විට,**

(i) අමුණකි (ii) කරීසයකි

(iii) පෑලකි (iv) තිරියකි

**21.** **මහවැව් තැනීමේ අරමුණක් නොවන්නේ,**

(i) ගංවතුර පාලනය

(ii) නාගරික ජනයාගේ අවශ්‍යතා ඉටුකිරීම

(iii) කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගැනීම

(iv) ඇළමාර්ග දෙපස තෙතමනය වර්ධනය කිරීම

**22.** **සංකීර්ණ ශල්‍යකර්ම සඳහා භාවිතා කරන මෙවලම් සොයාගන්නා ලද්දේ,**

(i) ආලාහාන පිරිවෙන කැනීමේදී

(ii) මිහින්තලේ රෝහල කැනීමේදී

(iii) පණ්ඩුකාභය රජු තනවන සිවිකාශාලා කැනීමේදී

(iv) පසවන්ති නාමශාලා කැනීම් කටයුතු වලදී

**23. ස්ථාන කිහිපයකින්ම අමුණු බැඳ දිගු දුරකට ඇළමාර්ග මගින් ජලය ගෙනයාම සඳහා යොදා ගත් ගංගාව වන්නේ,**

(i) මල්වතු ඔය (ii) කලා ඔය

(iii) යාන් ඔය (iv) මහවැලි ගඟ

**24. පහත "අ" තීරුව සමග "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුරු තෝරන්න.**

| | |
|---|---|
| ආරක්ෂක නිළධාරීන් | A. අන්යාවදාස |
| රාජකීය නිළධාරීන් | B. කුඩීන් |
| සාමාන්‍ය නිළධාරීන් | C. වෛයිකාප්පර් |
| පාරම්පරික නිළධාරීන් | D. රත්කොල් සව්දරු |

(i) D C B A (ii) C D A B

(iii) C D B A (iv) A D B C

**25 -26 ප්‍රශ්න සඳහා**

A - දකපති

B - බොජකපති

C - මකරමපිබත

D - කැතිකඩ කෙටුකනබ

E - අඩික

**25. නිශ්ශංක මල්ල රජු දවස හේන් වගාව සම්බන්ධ බදු වන්නේ,**

(i) E (ii) D (iii) C (iv) B

**26. රජුට අයත් ඉඩම්වල වගාකිරීම සම්බන්ධයෙන් ගෙවන බද්ද වන්නේ,**

(i) A (ii) B (iii) C (iv) E

**27. පහත සඳහන් වන රජවරු හා රැජිණියන් අතුරින් පොළොන්නරු රාජධානි සමයට අයත් වන්නන් පමණක් ඇතුළත් වන පිළිතුරු තෝරන්න.**

A - හතරවන පරාක්‍රමබාහු

B - තුන්වන විජයබාහු

C - ලීලාවතී රැජිණ

D - මහසෙන් රජු

E - කළ්‍යාණවතී රැජිණ

F - මහා පරාක්‍රමබාහු රජු

(i) C E F (ii) B C E

(iii) A C F (iv) C D B

| රජතුමා | ඓතිහාසික සිදුවීම |
|---|---|
| (A) III වන පරාක්‍රමබාහු | D - සිංහල සංගෙ නම් කැරැල්ල ඇතිවීම. |
| (B) IV පරාක්‍රමබාහු | E - දළදාව දකුණු ඉන්දියාවට රැගෙන යාම. |
| (C) VI පරාක්‍රමබාහු | F - පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම. |

**28. යාපහුව රාජධානි සමයේ සිදුවු ඓතිහාසික සිදුවීම හා රජතුමා,**

(i) A D (ii) A E (iii) B E (iv) C F

**29. කුරුණෑගල රාජධානි සමයේ ඓතිහාසික සිදුවීම හා එයට සම්බන්ධ රජතුමා සඳහන් පිළිතුර වන්නේ,**

(i) B F (ii) C E (iii) A F (iv) C D

**30. කෝට්ටේ රාජධානි සමයට අයත් ඓතිහාසික සිදුවීම හා එයට සම්බන්ධ රජතුමා වන්නේ,**

(i) B F (ii) C E (iii) C D (iv) A D

**31. පහත සඳහන් සිදුවීම් අතුරින් යාපන රාජධානියට සම්බන්ධ නිවැරදි සිදුවීම තෝරන්න.**

(i) කෝට්ටේ රාජධානි බිඳ වැටීමෙන් පසුව යාපන රාජධානිය ආරම්භ විය.

(ii) පෘතුගීසින් පැමිණෙන අවධියේ සංකිලි නම් රජු පාලකයා ලෙස කටයුතු කිරීම.

(iii) යාපනයේ බහුතර ජනතාව පෘතුගීසින්ට පක්ෂපාතී වීම.

(iv) ආර්යය චක්‍රවර්ති රජ පරපුර විසින් පාලනය ගෙන යාම.

**32. බිසවගේ සහෝදරයාට රජකම උරුම වීමේ සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වය හිමි වු පිළිවෙල දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

(1) දෙවන රාජසිංහ රජු - ශ්‍රී විජය රාජසිංහ රජු
(2) රාජාධිරාජසිංහ රජු - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
(3) දෙවන රාජසිංහ රජු - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු - ශ්‍රී විජය රාජසිංහ රජු

**33. දෙවන රාජසිංහ රජු විසින් පෘතුගීසින් මෙරටින් පලවා හැරීමෙන් පසු උඩරට රාජ්‍යයට අලුතින් අයිති කර ගැනීමට හැකිවු වරායන් වන්නේ,**

(i) පුත්තලම, කල්පිටිය, මඩකලපුව, හලාවත
(ii) මීගමුව, කල්පිටිය, හලාවත, පුත්තලම
(iii) මඩකලපුව, පුත්තලම, හලාවත, ත්‍රිකුණාමලය
(iv) කල්පිටිය, හලාවත, ත්‍රිකුණාමලය, මඩකලපුව

**34. ක්‍රි.ව. 1784 දී පදම් කළ යකඩ නිපදවීම සඳහා රෝලර් යන්ත්‍රය නිපදවීමේ ගෞරවය හිමි පුද්ගලයා වන්නේ,**

(i) ඒබ්‍රහම් ඩර්බි (ii) විලියම් සීමන්ස්
(iii) හෙන්රි කෝට් (iv) හම්ප්‍රිඩේවි

**35. ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ඉරාමස්, හා මාර්ටින් ලූතර්, යන පුද්ගලයින් වඩාත් ප්‍රසිද්ධියට පත්වුයේ කුමන කරුණක් සම්බන්ධයෙන්ද?**

(i) භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනයට සිදුකළ සේවය
(ii) රෝමානු කතෝලික සභාවේ ක්‍රියාකලාපය විවේචනය කිරීම
(iii) චිත්‍ර කලාවේ දියුණුවට දැක් වු දායකත්වය
(iv) විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කිරීම

**36. ක්‍රි.ව. 1811 ජොන් මැකඩම් විසින් හඳුන්වා දෙනු ලැබු මැකඩම් ක්‍රමය භාවිතා කරන ලද්දේ,**

(i) මහාමාර්ග තැනීම සඳහා ය.
(ii) යපස් උණු කොට යකඩ නිපදවීම සඳහා ය.
(iii) දුම්රිය මාර්ග තැනීම සඳහා ය.
(iv) යකඩ වල ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ය.

**37. ද්විත්ව පාලනය අසාර්ථක වීමත් සමඟ මෙරට සිදුවු පරිපාලනමය වෙනස්කම වන්නේ,**

(i) මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීමයි.

(ii) ලංකාව මුළුමනින්ම බ්‍රිතාන්‍යයට යටත් වීමයි.

(iii) මුහුදු බඩ ප්‍රදේශය උඩරටට යටත් කරගැනීමයි.

(iv) පාලන කටයුතු වෙළඳ සමාගමට පැවරීමයි.

**38. වර්ෂ 1848 අරගලය සමයේ ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන්නේ,**

(i) රොබට් බ්‍රවුන්රිග් ය (ii) රොබට් චාමස් ය

(iii) ටොරින්ටන් සාමිවරයා ය (iv) හියුක්ලිෆර්ඩ් ය

**39. කොළඹ ප්‍රදේශයේ ක්‍රිස්තු ආගම ප්‍රචාරණය කිරීමේ කටයුතු පැවරී තිබූ මිෂනාරි සමාගම වන්නේ,**

(i) වෙස්ලියන් (ii) ලන්ඩන්

(iii) ඇමරිකන් (iv) බැප්ටිස්ට්

**40. අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කරගැනීමේ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,**

(i) අනගාරික ධර්මපාල තුමා ය .

(ii) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.

(iii) පියදාස සිරිසේන මහතා ය.

(iv) වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා ය.

**ඉතිහාසය**

**I වන වසර වාර පරීක්ෂණය - 2022**

**11 වසර**

**II කොටස**

- **පළමු කොටසට අදාල සියලුම ප්‍රශ්න අනිවාර්ය වේ.**
- **දෙවන කොටසින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.**

**(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලට සපයා ඇති ලංකා සිතියමේද (ii) ලෝක සිතියමේද ලකුණු කරන්න.**

(i) කොළඹ,මහනුවර,ගාල්ල,ගෝකන්නතිත්ථ,කඳුරුගොඩ විහාරය, කිතුල්ගල බෙලිලෙන,කැළණි ගඟ,මාගම,ගල්ඔය, අනුරාධපුරය, දඹදෙණිය, සල්වතොට **(ල.12)**

(ii) පෘතුගාලය, ඉන්දියාව,බ්‍රිතාන්‍යය, ඕලන්දය, රෝමය, රතු මුහුද **(ල.06)**

(iii) පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අනුව අදාළ පිළිතුර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A සමන්ත පාසාදිකාව ග්‍රන්ථය රචනා කළ කතුවරයා

B අනුරාධපුරය රාජධානිය කරගත් ප්‍රථම රජු

C ලම්භකර්ණ වංශයේ ආරම්භක රජු

D මහා වංශයේ මුල් කොටස රචනා කළ භික්ෂුන් වහන්සේ **(ල.04)**

(iv) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(A) (i) A වලින් දැක්වෙන ශිලා ලිපිය කුමක්ද?

(ii) මෙම ශිලා ලිපිය පිහිටුවා ඇති ඓතිහාසික නගරය නම් කරන්න.

(iii) මෙම කරවන ලද රජතුමාගේ නම කුමක් ද?

(iv) එම රජු ආරූඪ කරගෙන සිටි රාජ්‍යත්ව සංකල්පය කුමක් ද?

**(ල.04)**

(B) (i) B රූපයෙන් දැක්වෙන චිත්‍රය දක්නට ඇති ස්ථානය නම් කරන්න.



(ii) මෙය කීවෙනි සියවසට අයත් ද?

(iii) මෙය කුමන රජු විසින් නිර්මාණය කරන ලද්දක් ද?

(iv) විද්වතුන්ගේ අදහස අනුව මෙම චිත්‍ර වලින් නිරූපිත එක් දෙයක් සඳහන් කරන්න. **(ල.04)**

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් 3 ක් ලියන්න. **(ල.03)**

(ii) මුල් ඓතිහාසික යුගයේ වාපි ගම්මාන 04 කට උදාහරණ දෙන්න. **(ල.04)**

(iii) අතීත රජවරුන් ජනතා විශ්වාසය ගොඩනගා ගැනීමට රටවැසියාට ඉටුකළ කාර්යයන් දෙකක් ලියා උදාහරණ දෙමින් විස්තර කරන්න. **(ල.05)**

(iv) ඓතිහාසික යුගයේ පැවැති ආර්ථික රටාව තුළ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. **(ල.06)**

(03) (i) අතීත ශ්‍රී ලංකාව තුළ පැවැති විදේශීය වෙළඳ සංවිධාන තුනක් නම් කරන්න. **(ල.03)**

(ii) පහත A B C D යටතේ දක්වා ඇති විදේශ සබඳතා හා සම්බන්ධ පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියන්න.

A රෝමානුක දේශයට තානාපතිවරුන් යැවීම.

B පාණ්ඩ්‍ය කුමාරයෙක් හට නැගණිය විවාහ කර දීම.

C චීනය සමඟ විසිවතාවක් දූත සම්බන්ධතා පැවැත්වීම.

D රතු කැට දිවයින නමින් ලංකාව හැඳින්වීම

(හයවන අග්ගබෝධි, පළමු වන ගජබාහු රජු, පළමු වන විජයබාහු රජු, හය වන අග්ගබෝධි රජු, ඉබන් බතූනා, අල් - බලසූරි) **(ල.04)**

(iii) අතීත සමාජය තුළ විවිධ වෘත්තීන් තිබූ බවට උදාහරණ දෙකක් දෙමින් විස්තර කරන්න. **(ල.05)**

(iv) පැරණි සමාජය තුළ පැවැති අධ්‍යාපනයේ ස්වභාවය හා වැදගත්කම කරුණු 03 ක් ඇසුරින් විස්තර කරන්න. **(ල.06)**

(04) (i) A - කුඩා ස්ථූප ආවරණය කිරීම සඳහා තැනූ ගොඩනැගිල්ල

B - වැවක ඇතිවන දිය රැලි වලින් වැව් බැම්ම සේදීයාම වැළැක්වීම සඳහා කළ නිර්මාණය

C - අකුණු සැරවලින් ආරක්ෂා වීම සඳහා විශාල ස්ථූප මුදුනේ සවිකළ උපකරණය **(ල.03)**

(ii) අතීත රජවරුන් විසින් මහ වැව් තැනවීම පාදක වු අරමුණු දෙකක් ලියන්න. **(ල.04)**

(iii) පැරණි කාලයේ කාන්තාව සමාජයේ දැඩි බැඳීම් වලින් පීඩාවට ලක් නොවු බව කරුණු දෙකක් ඇසුරින් පෙන්වන්න. **(ල.05)**

(iv) "යහපත් සෞඛ්‍යය තත්ත්වයක් ආරක්ෂා කර ගැනීමට අතීත ආහාර රටාවෙන් මනා පිටුවහලක් ලැබීය." කරුණු 03 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. **(ල.06)**

(05) (i) ශ්‍රී ලංකාවේ පළමු වැනි නාගරිකකරණයට අයත් පැරණි පරිපාලන නගර තුනක් නම් කරන්න. **(ල.03)**

(ii) පළමු වැනි නාගරිකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ හේතු 04 ක් සඳහන් කරන්න. **(ල.04)**

(iii) දඹදෙණි රාජධානියේ රජකළ දෙවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ල.05)**

(iv) දෙවන නාගරීකරණ අවධියේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇති වු වෙනස්කම් තුනක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. **(ල.06)**

(06) (i) පහත A B C හි සඳහන් සිද්ධින් සම්බන්ධ පුද්ගලයින් කවුරුන් දැයි පිළිවෙලින් ලියා දක්වන්න.

A - උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල්වරට ස්වාධීන රාජධානියක් ගොඩනගන ලද රජතුමා

B - දොන් පිලිප් නමින් පෘතුග්‍රීසින් වෙතින් බෞතිස්ම ලැබු කුමාරයා

C - නායක්කාර්වාංශික පළමු රජු **(ල.03)**

(ii) I වැනි විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝග හතරක් සඳහන් කරන්න. **(ල.04)**

(iii) උඩරට රාජධානි සමයේ තිබු ආර්ථික රටාව පිළිබඳ විස්තරයක් කරන්න. **(ල.05)**


(iv) උඩරට රාජධානියේ සමාජ සංවිධානය වී තිබු ආකාරය කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. **(ල.06)**

(07) (i) ඉන්දියානු සාගරය අවට රටවල වෙළඳ තරඟයක යෙදී සිටි යුරෝපීය ජාතින් තුනක් නම් කරන්න. **(ල.03)**

(ii) ත්‍රිකුණාමලය වරාය බ්‍රිතාන්‍යයින්ට වැදගත් වීමට බලපෑ හේතු 02 ක් සඳහන් කරන්න. **(ල.04)**

(iii) 1818 ඌව වෙල්ලස්ස සටනට පසුබිම් වු හේතු දෙකක් සඳහන් කරන්න. **(ල.05)**

(iv) 1803 නෝර්ත් ආණ්ඩුකාරයා හට උඩරට රාජධානිය අත්පත් කර ගැනීමට නොහැකි වු හේතු තුනක් පෙන්වා දෙන්න. **(ල.06)**


N
R.A.C

